ජේෂ කර්මාන්තය

- ජන කලාවක් ලෙස මෙය ගොඩනැගී පසුව කාර්මික විප්ලවයෙන් අනතුරුව යන්ත්‍ර සූත්‍ර භාවිත කරමින් ගොඩනැගුණු අතර වර්තමානයේ මහා පරිමාණ කර්මාන්තයක් බවට පත්ව ඇත.
- ජේෂ කර්මාන්තය මිනිසාගේ මූලික අවශ්‍යතාවයක් වන රෙදි පිළි නිෂ්පාදනයට දායක වේ.
- ජේෂ කර්මාන්තයේ ප්‍රධාන අමුද්‍රව්‍යය වන්නේ නූල්ය.
- නූල් සඳහා කෙඳි ලබා ගන්නා ක්‍රම කිහිපයකි.
    1. ශාකමය කෙඳි
    2. සත්වමය කෙඳි
    3. ඛනිජමය කෙඳි
    4. කෘතිම කෙඳි
- කෙඳි ලබා ගන්නා ශාක කිහිපයක් නම්,කපු, හණ,නියද,රැමි,අන්නාසි,කෙසෙල්
- කෙඳි ලබා ගන්නා සතුන් කිහිපයක් නම් බැටළුවා,එළුවා,ලාමා,ඇල්පකා, විකුණා නම් වේ.
- උසස් තත්වයේ කෙඳි ලබා දෙන සත්වයා මැරිනෝ නම් බැටළුවා ය.
- කෙඳි ලබා ගන්නා සතුන් අතර පට පණුවා විශේෂ තැනක් ගනී.
- ඛණිජමය නූල් වලින් සකස් කර ගත් නූල් වන්නේ රන්,රිදී,වීදුරු,ඇස්බැස්ටස් ය.

සකසන අයුරු-: රෙදි විවීමට භාවිත කරන කැරළි නූල් මුලින්ම දික් නූල් කූරු වලට ඔතා ගනී.එය ඔතා ගන්නේ එතුම් රෝද ආධාරයෙනි.එසේ ඔතා ගත් දික් නූල් කූරු ක්‍රිල් එකේ(දික් නූල් කූරු රාක්කය)අසුරා ගනී. නූල් බෙත්ම ආධාර කරගෙන නූල් තට්ටු වශයෙන් කොටස් දෙකකට වෙන් කර සීරු දැමීම සිදු කර නූල් බෙරයේ ඇති ඇණ වල දවටා ගැනේ.අවශ්‍ය ප්‍රමාණයට නූල් බෙරයේ පළල මැන ගත යුතු ය. එම ප්‍රමාණයට අනුව නූල් බෙරයට රිපීටය බැගින් දමා ගත යුතු ය. නූල් බෙරයේ ඔතා ගත් නූල් අනතුරුව වට කඳ නම් විවීමේ යන්ත්‍රයේ කොටසකට සම්බන්ධ කර ගනු ලැබේ. පුඩුවැල් ජේළි වලින් රටාවකට ඇඳ ගන්නා නූල් පනාව (රීඩ් එක) නම් වූ යාන්ත්‍ර කොටස හරහා යන්ත්‍රයේ පෙර කඳට සම්බන්ධ කරයි. නූල් විවර ලබා ගැනීම සහ පාපොළ පාගා විවීමට හැකි ආකාරයට මෙම නූල් හැදය යාන්ත්‍ර ගත කරයි.එසේ යාන්ත්‍ර ගත කරන ලද නූල් හැදයේ විවර හරහා හරස් නූල් යෙදීමෙන් විවීම සිදු කරයි.හරස් නූල් යොදන්නේ නඩාව ආධාරයෙනි. අළුව නම් කොටසින් හරස් නූල් තද කරගනී.වියන රෙදි යන්ත්‍රයේ ඇති පිළි කඳට එතීම සිදු වේ.

පහත දැක්වෙන්නේ අත් යන්ත්‍ර රෙදි විවීමේ උපකරණයකට සම්බන්ධ කොටස් කීපයකි.




දික්නූල් කුර




පනාව







නූල් හැදය වටකඳට එතීම



පුඩුවැල් පේලිය



දික්නූල් කුරු රාක්කය



නූල් බෙරය



1. යන්ත්‍ර රාමුව
2. නූල් කඳ
3. පිළි කඳ
4. පුඩු වැල්
5. අලුව
6. පනාව
7. ලීවර රාමුව